# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

**ඒකක පරීක්ෂණය**

**11 ශ්‍රේණිය** | **පුරවැසි අධ්‍යාපනය** | ඒකකය 4 - පාරිසරික ගැටලු හා තිරසර සංවර්ධනය

- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්න සඳහා වඩාත් නිවැරදි පිළිතුර තෝරන්න.**

**01.** ''ජීවියෙකු වටා ඇති භෞතික, රසායනික හා ජෛවීය තත්ත්වය පරිසරයයි'' යනුවෙන් නිර්වචනය කරනු ලැබුවේ,

1) සියැටල් 2) මයිකල් ඇල්බි
3) ගැරන් ජෝන්ස් 4) පරිසර ශබ්ද කෝෂය

**02.** අජෛවී පරිසරයේ සංරචකයක් නොවන්නේ,

1) වායුගෝලය 2) පාෂාණ
3) දේශගුණය 4) ශාක හා ක්ෂුද්‍ර ජීවීන්

**03.** පරිසරයෙන් ලැබෙන සේවා අතුරින් ජීව උපකාරක සේවාවක් වන්නේ,

1) ජලය 2) භූමිය
3) ජල විදුලිය 4) සුළං බලය

**04.** ස්වභාවික සංසිද්ධි ඇසුරින් භෞතික පරිසරයට සිදුවන හානියක් වන්නේ,

1) සුළි කුණාටු 2) සාගර ජල මට්ටම ඉහළ යාම
3) ඕසෝන් ස්ථරය 4) කාන්තාරකරණය

**05.** ශිලා ගෝලයට සිදුවී ඇති හානි නිසා ඇතිවන බලපෑමක් නොවන්නේ,

1) ජලජ ජීවීන් මියයාම 2) පාරිසරික සෞන්දර්ය විනාශවීම
3) ජල ගැලීම් ඇතිවීම 4) පස නිසරු වීම

**06.** වායු දූෂණය සිදුවන ස්වභාවික ක්‍රමයක් වන්නේ,

1) කර්මාන්තශාලා 2) ගුවන්යානා භාවිතය
3) කැළි කසල 4) ගිනි කඳු පිපිරීම

**07.** ''සංවර්ධනය යනු ජන සංඛ්‍යාව, සමාජීය, සංස්කෘතික හා සදාචාරාත්මක යන සාධක ද ඇතුළත් වෙනස්වීම් හා වර්ධනය පිළිබඳ ක්‍රියාදාමයකි'' මෙම නිර්වචනය ඉදිරිපත් කරනු ලැබුවේ,

1) 1978 යුනෙස්කෝ ප්‍රකාශනය 2) එක්සත් ජාතීන්ගේ සංවිධානය
3) ඩඩ්ලි සියර්ස් 4) කිංඩල් බර්ගර්

**08.** සංවර්ධන මිනුම් අතුරින් සම්ප්‍රදායික මිනුමක් වන්නේ පහත මිනුම් අතරින් කවරක්ද?

1) දුරකථන ඝනත්වය
2) භෞතික ජීවන තත්ත්ව දර්ශකය
3) දළ ජාතික නිෂ්පාදනය
4) මානව සංවර්ධන දර්ශකය

**09.** පහත ලක්ෂණ අතරින් සංවර්ධනය වන රටක ලක්ෂණයක් වන්නේ කුමක්ද?

1) කාර්මික දායකත්වය වැඩිය
2) ළදරු මරණ අනුපාතය ඉහළය.
3) නාගරික ජන සංඛ්‍යාව වැඩිය
4) සාක්ෂරතාවය ඉහළය.

**10.** සංවර්ධනය වෙමින් පවත්නා රටක් සඳහා උදාහරණයක් වන්නේ පහත රටවල් අතුරින් කවර රටද?

1) බ්‍රිතාන්‍ය
2) ඉන්දියාව
3) ඕස්ට්‍රේලියාව
4) ඇමරිකා එක්සත් ජනපදය

- **ප්‍රශ්න අංක 11 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

**1.** පරිසරය පිළිබඳව ඉදිරිපත් වී ඇති නිර්වචන අතුරින් එකක් ලියා දක්වන්න.
**2.** ජීව උපකාරක සේවා යනු මානවාදයි කෙටියෙන් පැහැදිලි කරන්න.
**3.** පාරිසරික ගැටලු ඇතිවීමට බලපාන ස්වභාවික හේතු දෙකක් දක්වන්න.
**4.** ශිලා ගෝලයට සිදුවන හානි නිසා ඇතිවන බලපෑම් දෙකක් ලියන්න.
**5.** වනහානිය නිසා ඇතිවී තිබෙන අහිතකර ප්‍රතිඵල දෙකක් ලියන්න.
**6.** පරිසරය හා සම්බන්ධ රජයේ වගකීම් හා යුතුකම් දෙකක් ලියන්න.
**7.** සංවර්ධිත රටවල් මුහුණපාන ගැටලු දෙකක් ලියන්න.
**8.** තිරසර සංවර්ධන ළඟාකර ගැනීමේදී ජය ගත යුතු අභියෝග දෙකක් ලියන්න.
**9.** ශ්‍රී ලංකාවේ සංවර්ධන අභියෝග ජයගැනීමට ගෙන ඇති ක්‍රියාමාර්ග දෙකක් දක්වන්න.
**10.** සංවර්ධනය වන රටක් ලෙස ශ්‍රී ලංකාවේ විශේෂත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

- **පහත ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

01. 1) පරිසර පද්ධතිය සකස් වී ඇති සංරචක මොනවාද?
2) පරිසරය හා මිනිසා අතර ඇති සම්බන්ධතාවය කෙටියෙන් පැහැදිලි කරන්න.
3) මිනිසා මූලික වීමෙන් සිදුවී ඇති පාරිසරික ගැටලු තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

02. 1) සංවර්ධනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
2) සංවර්ධනය මැනීමේ පරමාර්ථ තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
3) ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදනය යනු කුමක්දැයි කෙටියෙන් පැහැදිලි කොට එම දර්ශකයේ අඩුපාඩු තුනක් ලියා දක්වන්න.

03. 1) භෞතික ජීවන තත්ත්ව දර්ශකය සකස් කිරීම සඳහා යොදාගනු ලබන සංරචක තුන ලියා දක්වන්න.

2) සංවර්ධනය වෙමින් වතින රටවලට බලපානු ලබන ගැටලු තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

3) සංවර්ධිත රටවල් මුහුණපාන ගැටලු තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

04. 1) තිරසාර සංවර්ධනය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

2) තිරසර සංවර්ධනය සම්බන්ධයෙන් පුරවැසියා සහ යුතුකම් තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

3) තිරසර සංවර්ධනය පිළිබඳ රජයේ වගකීම් යුතුකම් තුනක් දක්වා ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.

සැකසුම:-අයි.ඩබ්.ජ්. අයෝමි මිය